# සිංහල කාව්‍ය සංග්‍රහය
# ළමා කවි

ළමයි යනු ගැඹුරු යමක් තේරුම් ගත හැකි පිරිසක් නො වෙති. ඔවුන් වෙනුවෙන් කෙරෙන කටයුත්තකදී මෙය හොඳින් සිතේ තබාගෙන ඔවුනට වැටහෙන සේ ඔවුන්ගේ සිතුම් පැතුම් හා අත්දැකීම් ද සැලකිල්ලට ගනිමින් එය කළ යුතු ය. නූතන කාව්‍ය සංග්‍රහයේ හමුවන කවීන් මෙය කොතරම් දුරට සැලකිල්ලට ගත්තේ දැයි විමසමු.

“ගීතිකා - චෝ රසයි
හා කුරුල් - ලන්ගෙ දෝ

මේ කතා - බස් ඇසෙන්
නෙත් කුරුල් - ලන්ගෙ දෝ” (කුරුල්ලෝ)

ගැඹුරු අරුත් කිසිවක් නැත. දිග කතා කීමක් ද නැත. කෙටි පද්‍ය පාද ළමයින්ට කියවීමට ද පහසු ය. ඒ නිසා ම ළමුනට රසවිඳීමට ද පහසු ය.එක ම වචනය දෙකට කඩා පාද දෙකකට යොදා ඇති අයුරු වැඩිහිටියන් සඳහා නම් දෝෂයක් වෙයි. එහෙත් ළමුන් ගැන සැලකීමේදී එය වඩා සුදුසු ක්‍රමයක් වෙයි.

“ටික්කි ටිකිරි සුරතල් ළදැරියක් වගේ
කැකිරි සිනාවෙන් බැස ආ ගමනෙ අගේ” (ගඟ)

කුඩා දරුවන්ට ඉතා හුරු අත්දැකීමක් එනම් සුරතල් ළදැරියක පිළිබඳ චිත්තරූපයක් සිතට නංවමින් කියන මේ කියමනෙන් ගංගාව පිළිබඳ චමත්කාර සිතුවිල්ලක් ළමා සිත තුළ ජනිත කරවීමට කවියා සමත් නොවන්නේ ද? ටික්කි ටිකිරි, කැකිරි සිනා වැනි වචනවලින් දරුවාගේ සිත තවත් රසයට සමීප කරවයි. ගංගාවේ සුන්දරත්වය දරුවා තම බාල සොයුරියගේ සුරතල්කම් ඇසුරින් විඳ ගනී.

“දණ්ඩි කූනි පෙතියෝ ගොඩයෝ ඉස්සසෝ
පැන්නෝ කටිල්ලලෝ කාවයියෝ කොස්සෝ” (ගඟ)

අර්ථයක් වශයෙන් ගත් කල කිසිවක් ඇත්තේ ම නැත. නම් වැලක් පමණි, ඇත්තේ. එහෙත් මේ වචන පෙළින් නැගෙන ධ්වනිය මාළුන්ගේ දැඟලිල්ල ළමා සිතේ රූපවත් කරන්නට සමත් වන බව අමුතුවෙන් විස්තර කළ යුතු ද? මාළුවෝ එක තැනක තත්පරයක කාලයක් වත් නොසිට එහා මෙහා පිහිනමින් දඟලති. උන්ගේ ඒ දඟකාරකම

මේ වචන වැලෙන් නැගෙන ශබ්ද ධ්වනිය ළමා සිත තුළ මැනවින් චිත්‍රණය කරවයි. ඒ මගින් දරුවා කුල්මත් කරවයි.

‘දිළිහි දිළිහි      බැබළි බැබළි
ආකාසේ      ආකාසේ
බබළන මල් තාරකා      දිළිහෙන මල් තාරකා”
(තාරකා)

අහස දෙස බලමින් දිළිහෙන තරු ගණිමින් විනෝද වන දරුවන් පිරිසක් මෙයින් අපට මැවී නොපෙනෙන්නේ ද? ගැඹුරු අරුත් කිසිවක් නැත. ඇත්තේ තරු දකින විට විවිධ ගැඹුරු සංකල්පනාවන් මවන්නට සිතුම් පැතුම් මෝරා නැති දරුවන්ගේ අදහසක් පමණි. කවියා යොදාගත් වචන වුව ද දරුවන්ගේ සිත් ගන්නට සමත් වෙයි. එක ම වචන මාලාවක් මඳක් වෙනස් කරමින් පද්‍ය දෙකක් රචනා කරමින් දරුවන්ට රසවත් හැඟීමක් දෙන්නට කවියා සමත් වූ සැටි අපූරු නොවේ ද?

“පියා හඹත් කූඩුවලින් කුරුල්ලෝ
ඉතා ම මීරියි හඬ දැන් ඔවුන්ගේ
සුළං වැදීමෙන් උදයේ සිහිල් වූ

අලුත් පණක් ගස්වලටත් ලැබිලාණී ....:උදය–

උදයේ ඇති ප්‍රබෝධවත් බව ළමා සිතට ඇතුළු කරවන්නට කවියා යොදාගත් මේ යෙදුම් කොතරම් ශක්තිමත් දැයි සිතන්න. කුරුල්ලා ළමයාගේ මිතුරෙකි. ඒ මිතුරන් අහස පුරා සැරිසරන හැටි ළමා සිතේ ප්‍රසන්න චිත්තරූප දනවයි. ඔවුන්ගේ හඬත් ඒ සිත තුළ මිහිරි සංකල්ප උපදවයි.මේ මගින් ළමා සිත තුළ අලුයම පිළිබඳව ඇති කරවන හැඟීම ළමයාට අමතක නොවන රසවත් අත් දැකීමකි. උදයේ ඇති සිසිල් සුළඟ පිළිබඳ මතකය ඒ ප්‍රබෝධවත් බව තවත් වැඩි කරවයි. ගස් වැල් වල ඇති ප්‍රබෝධවත් බව ළමයාගේ සිත මෙන් ම ගත ද පුබුදුවයි.

ඇඟත් සැහැල්ලුයි - සිතෙහිත් බරක් නෑ
පොතින් වැඩක් ගන්නට මේ වෙලාවයිණී ....:උදය–

උදයේ ඇති වූ ප්‍රබෝධය දරුවාගේ සිතට ඇතුළු කළ කවියා ඊළඟට දරුවාට උපදේශයක් දෙයි. වඩා වැදගත් වන්නේ එය දුන් ආකාරයයි. ඔහු දරුවා අමතා ඔබ වෙය කළ යුතු යයි නො කියයි. ඒ අවස්ථාවේදී දරුවාගේ සිත තුළින් ම එය ඇති වන ආකාරයටයි, දැක්වෙන්නේ. ඒ මගින් ළමයා ඉබේ ම එහි යෙදීමට පෙළඹේ. එය ඔහුගේ ප්‍රබෝධය නිසා ම ඇති වූවක් වන බැවිනි.

හා හා හරි හාවා - කැලේ මැදින් ආවා
හිටගෙන ගඟ ගාවා - වට පිට ඇහැ ලෑවා

කොල දෙකටක් කෑවා - පැන් උගුරක් බීවා
තොලකට ලෙව කෑවා - ඉතින් ඇතැයි කීවා
:හාවාගේ වග–

ළමයා ඉතා අගේ කරන සතෙකි, හාවා. මේ කියමන් නිසා ඒ සුරතල් හාවා ළමයා ඉදිරියේ දුව පැන ඇවිදින හැටි ළමයාට මැවී පෙනේ. ඒ සුන්දර චිත්ත රූපයට කවර නම් දරුවෙකු කැමති නොවන්නේ ද? ළමයා බත් දෙකටක් කයිත පැන් උගුරක් බොයිත වෙනත් කුමක් හෝ සිහිපත් වීමෙන් දන් කෑම ඇතැයි සිතා යන්නට සැරසෙයි. හාවා ද එසේ ය. මෙසේ මේ කරන නිරූපනයෙන් හාවා පිළිවඳ මේ සිදුවීම ළමයාට කොතරම් සමීප දෙයක් ද?

පද්‍ය පන්තියේ අවසානය බලමු.

ණීබිරුම් හඬක් ආවා - ඉහල වීසි වූවා
කොඳු ඇට හිටවූවා - කන් දෙක දිග පෑවා

”